# නිපුණතා පාදක විෂය නිර්දේශය

## මූලික පිරිවෙණ

**(01 - 05 ශ්‍රේණි)**

# පාලි විසයනිද්දෙසො

(2017 සිට ක්‍රියාත්මක වේ.)

පිරිවෙන් අධ්‍යාපන ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය,

ඉසුරුපාය, බත්තරමුල්ල

**පාලි - නිපුණතා පාදක විෂය නිර්දේශය - මූලික පිරිවෙණ 01 - 05 ශ්‍රේණි**

**ප්‍රථම මුද්‍රණය 2016**

**පිරිවෙන් අධ්‍යාපන ශාඛාව**
**අධ්‍යාපන අමාත්‍යාංශය,**
**ඉසුරුපාය,**
**බත්තරමුල්ල.**

Web: www.pirivena.sch.lk
E mail:piriven@moe.gov.lk

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින්
මල්වාන, වඩුවේගම පාර, අංක 765/2, හි පිහිටි ආර්. එස්. ප්‍රින්ටෙක් පුද්. සමාගමෙහි
මුද්‍රණාලයේ මුද්‍රණය කරවා ප්‍රකාශයට පත් කරන ලදී.

# පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂ නාහිමිපාණන්ගේ පණිවුඩය

ලෝකයේ දියුණු නොදියුණු සෑම රටක ම කලින් කලට අධ්‍යාපනයට අදාළ නව විෂය නිර්දේශ හඳුන්වා දීම හෝ පවත්නා විෂය නිර්දේශ සංස්කරණය කිරීම කරනු ලබයි. මෙමගින් විෂය නිර්දේශයේ අන්තර්ගතය කාලීන අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි සකස්කර ගැනීමටත් විෂය නිර්දේශය නව ආකෘතියකින් ඉදිරිපත් කිරීම මගින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය වඩාත් පහසු හා සාර්ථක කරගන්නටත් අවස්ථාව සැලසේ.

අනුව දශකයේ දී ජාතික අරමුණු නවයක් හා පොදු නිපුණතා පහක් සාක්ෂාත් කර ගැනීම ඉලක්ක කොටගෙන විෂය නිර්දේශ ප්‍රතිසංස්කරණය කරනු ලැබිණ. මෙම සහස්‍රයේ විෂය නිර්දේශ සකස් කිරීමේ දී යොදා ගන්නා ලද්දේ නිපුණතා පාදක ක්‍රමයයි. මෙම ක්‍රමය පාසල් අධ්‍යාපනයට හඳුන්වා දී දැනට වසර කීපයක් ම ගත වී හමාර ය. ඒ අනුව නවීන අධ්‍යාපන ක්‍රමවේදයක් වන නිපුණතා පාදක ඉගැන්වීම් ක්‍රමය පිරිවෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයට ද හඳුන්වා දීම අපේ අරමුණ යි. පහත දැක්වෙන්නේ නිපුණතා පාදක ක්‍රමය පිළිබඳ පිළිගත් විග්‍රහයකි.

''කිසියම් විෂය ක්ෂේත්‍රයකට අදාළ අත්‍යවශ්‍ය විෂය කරුණු, මූලධර්ම හා ක්‍රම ශිල්ප ප්‍රායෝගික ආකාරයෙන් සුසංයෝගී ලෙස යොදා ගැනීමේ හැකියාව නිපුණතාව යි.''

(අධ්‍යාපන විශ්වකෝෂය)

සැකෙවින් කිවහොත් නිපුණතාවක් යනු දැනුම, ආකල්ප, කුසලතා හා අන්තර් පුද්ගල හැකියා ඒකරාශී වී ගොඩ නැගෙන ජීවිත පුරුද්දකි. ධනාත්මක ජීවිත පුරුදු ඇති කිරීම නිපුණතා පාදක විෂය නිර්දේශයක අරමුණ යි.

නිවැරදි, පැහැදිලි හා විධිමත් විෂය නිර්දේශයක් ගුරුවරයාටත් ශිෂ්‍යයාටත් එකසේ වැදගත් වෙයි. විෂය නිර්දේශයෙන් පෙන්වා දෙන මාර්ගයේ ශිෂ්‍යයා කැඳවාගෙන යාම ගුරුවරයාගේ කාර්යය යි. එම ගමන නිමාවිය යුත්තේ ශිෂ්‍යයා විසින් ඉගෙනුම් පල අත්පත්කර ගැනීමෙනි. එවිට ශිෂ්‍යයාට මෙන් ම ගුරුවරයාට ද ඉගෙනුම් පල දැකීමෙන් සතුටට පත්විය හැකි ය.

කලකට පෙර පිරිවෙන් අධ්‍යාපනයට ම ආවේණික වූ විෂය නිර්දේශයක් විය. එහෙත් කාලයත් සමඟ පිරිවෙන් විෂය නිර්දේශය පාසල් විෂය නිර්දේශය තුළ නිමග්න වී ඇතුවා සේ ය. මේ නිසා ගිහි ශිෂ්‍යයාගේ අරමුණු හා ආකල්ප පැවිදි ශිෂ්‍යයාට ද නිරායාසයෙන් උරුම වෙමින් පවතියි. ඒ හේතුවෙන් පැවිදි ශිෂ්‍යයා තමන්ට අදාළ ඉලක්ක වෙනුවට ගිහි ශිෂ්‍යයාගේ ඉලක්ක කරා ගමන් කිරීමෙන් ගමන නිමා වන බවක් දක්නට ලැබෙයි. මේ තත්ත්වය මත පාසල් අධ්‍යාපනයට අදාළ වූ විෂයයක් වුව ද පිරිවෙණේ ඉගැන්විය යුත්තේ පැවිද්දාට අදාළ ආකල්ප හා කුසලතා වර්ධනය කරවන පිරිවෙණට ම ආවේණික විෂය නිර්දේශයක් ඔස්සේ ය.

මේතාක් ලෝකයේ අධ්‍යාපන අරමුණු ප්‍රධාන වශයෙන් ඉලක්ක ගත වී පැවතියේ භෞතික දියුණුව සාර්ථක කරගනු පිණිස ය. එහෙත් දියුණු ලෝකයේ රටවල් මේ වන විටත් එහි අනිසි විපාක අත්විඳිමින් සිටින බැවින් අනාගත ලෝකයේ අධ්‍යාපනික අරමුණු සකස් වෙමින් පවත්නේ භෞතික දියුණුව මෙන් ම ආධ්‍යාත්මික ශික්ෂණය ද අරමුණු කොටගෙන ය. එබැවින් පිරිවෙන් අධ්‍යාපන විෂය නිර්දේශ මගින් එකී අවශ්‍යතාව ඉටුකර ගැනීම අපගේ අරමුණ යි.

**මහාචාර්ය, රාජකීය පණ්ඩිත, නාබිරිත්තන්කඩවර ඥාණරතන හිමි**
අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)
2016. 12. 14

# අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්තුමාගේ පණිවුඩය

ශ්‍රී ලංකාව තුළ බුද්ධධර්මය ස්ථාපිත වීමත් සමග ම විහාරාරාම ගොඩනැංවීම ආරම්භ විය. දිවයිනේ ප්‍රධාන විහාරස්ථාන කේන්ද්‍ර කර ගනිමින් "පිරිවෙණ" නමැති විද්‍යායතනය බිහි විය. ගිහි පැවිදි දෙපක්ෂයට ම අවශ්‍ය වූ කලා ශිල්ප, භාෂා හා සමය සමයාන්තර ඥානයත්, යහපත්, ගුණ ගරුක සමාජයක් බිහි කිරීමට අවශ්‍ය සාරධර්ම අධ්‍යාපනයත් බෙදා දුන්නේ පිරිවෙණ මගිනි. එම සාම්ප්‍රදායික අනන්‍යතාව රැක ගනිමින් ම, කාලීන අවශ්‍යතා ද සපුරාලමින් යහපත් සමාජයක් ගොඩනැගීමේ කාර්යය ඉදිරියට ගෙන යාමට පිරිවෙණ ඉටු කරන කාර්යභාරය සුළු කොට තැකිය නොහැකි ය.

පිරිවෙණේ අධ්‍යාපනය ලබන පැවිදි ගිහි සිසුන්ගේ ඉගෙනුම් ක්‍රියාවලිය වඩාත් ඵලදායී කිරීමට සහ පරිවේණාචාර්යවරුන්ගේ ඉගැන්වීම් ක්‍රියාවලිය ගුණාත්මක ව සංවර්ධනය කිරීම සඳහා 2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක කෙරෙන නව විෂය නිර්දේශ මුද්‍රණය කර ප්‍රථම වරට ලබා දීමට හැකිවීම ඉමහත් සතුටකි.

**අයි. එම්.කේ. බී. ඉලංගසිංහ**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
ඉසුරුපාය
බත්තරමුල්ල
2016. 12. 14

# විෂය නිර්දේශ කමිටුව

- **උපදේශකත්වය හා අනුමැතිය** -
  අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)
  මහාචාර්ය, රාජකීය පණ්ඩිත
  **පූජ්‍ය නාබිරිත්තන්කඩවර ඤාණරතන හිමි**
  පිරිවෙන් අධ්‍යාපන ශාඛාව,
  අධ්‍යාපන අමාත්‍යාංශය.

- **විෂය විශේෂඥ උපදේශනය** -
  මහාචාර්ය, රාජකීය පණ්ඩිත
  **පූජ්‍ය මකුරුප්පේ ධම්මානන්ද හිමි**
  පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය,
  කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය.

- **විෂය සම්බන්ධීකරණය** -
  පාලි විෂය උපදේශක (පිරිවෙන්),
  **පූජ්‍ය බණ්ඩාරවෙල රතනසාර හිමි**
  පිරිවෙන් අධ්‍යාපන ශාඛාව,
  අධ්‍යාපන අමාත්‍යාංශය.

- **ලේඛක මණ්ඩලය** -

01. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, රාජකීය පණ්ඩිත
    **පූජ්‍ය ගෝනදෙණියේ පඤ්ඤාරතන හිමි**
    පාලි අධ්‍යයන අංශය,
    ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, හෝමාගම.

02. කථිකාචාර්ය, රාජකීය පණ්ඩිත
    **පූජ්‍ය විජිතපුර ගුණරතන හිමි**
    පාලි අධ්‍යයන අංශය,
    ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, හෝමාගම.

03. දර්ශනපති,
    **පූජ්‍ය වැවගෙදර සීලක්ඛන්ධ හිමි**
    පාලි ගුරු උපදේශක, ගම්පහ දිස්ත්‍රික්කය.

04. රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රවේදී,
    **පූජ්‍ය පුස්සැල්ලාවේ ඤාණරතන හිමි**
    බාහිර කථිකාචාර්ය,
    කොළඹ විශ්වවිද්‍යාලය.

05. රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති
    **පූජ්‍ය මුවපැටිගේවෙල පඤ්ඤාලොක හිමි**
    බාහිර කථිකාචාර්ය, කැලණිය විශ්වවිද්‍යාලය.

06. පාලි විෂය උපදේශක (පිරිවෙන්),
    රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති,
    **පූජ්‍ය බණ්ඩාරවෙල රතනසාර හිමි**
    පිරිවෙන් අධ්‍යාපන ශාඛාව,
    අධ්‍යාපන අමාත්‍යාංශය.

07. රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති,
    **පූජ්‍ය කොටියාගල ධම්මරතන හිමි**
    පශ්චාද් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා, (ගෞරව)
    පාලි විෂය භාර ආචාර්ය,
    විද්‍යාරවින්ද මහා පිරිවෙණ,
    පහළගම, ගම්පහ.

08. රාජකීය පණ්ඩිත,
**පූජ්‍ය හටංගල සුමේධ හිමි**
පාලි ගුරු උපදේශක, රත්නපුර දිස්ත්‍රික්කය.

09. ශාස්ත්‍රවේදී (ගෞරව), ශාස්ත්‍රපති,
**ඩී. එම්. එස්. දිසානායක මයා**
පාලි විෂය භාර ආචාර්ය,
විද්‍යාධාර මහා පිරිවෙණ,
කලාකරඹෑව, අනුරාධපුර.

- **පරිගණක වදන් සැකසුම**

01. රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති,
**පූජ්‍ය කොටියාගල ධම්මරතන හිමි**
පශ්චාද් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා, (ගෞරව)
පාලි විෂය භාර ආචාර්ය,
විද්‍යාරවින්ද මහා පිරිවෙණ,
පහළගම, ගම්පහ.

02. පාලි විෂය උපදේශක (පිරිවෙන්),
රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති,
**පූජ්‍ය බණ්ඩාරවෙල රතනසාර හිමි**
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව,
අධ්‍යාපන අමාත්‍යාංශය.

- **පිටකවර නිර්මාණය** - ශයිනි ඉමල්ෂා විජේවර්ධන
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

# විෂය අධ්‍යයනයේ අරමුණු

1. පාලි භාෂාව නිවැරදි ව උච්චාරණය කිරීමේ හා ලිවීමේ හැකියාව ඇති කිරීම
2. පාලි භාෂාවේ අක්ෂර වින්‍යාසය, විවිධ පද, විවිධ වාක්‍ය රටා හා රචනය හුරු කිරීම
3. පාලි ගද්‍ය පද්‍ය පාඨ මාතෘ භාෂාවටත් මාතෘ භාෂාවෙන් පාලි භාෂාවටත් පරිවර්තනය කිරීමේ හැකියාව ඇති කිරීම
4. පාලි සාහිත්‍යය පිළිබඳ අවබෝධයක් ලබා දීම හා එහි එන ජීවන දර්ශනය උපයෝගී කරගනිමින් පෞරුෂේය චරිතයක් බිහි කිරීම
5. ත්‍රිපිටකාගත හරධර්ම චරිතායනය කෙරෙන ආදර්ශවත් හා මනා පෞරුෂයක් සහිත භික්‍ෂු පරපුරක් රටට දායාද කිරීම
6. පාලි භාෂාව පිළිබඳ දැනුම සිංහල භාෂාඥානයේ ප්‍රවීණත්වය සඳහා අත්‍යවශ්‍ය සාධකයක් බව තහවුරු කිරීම
7. පාලි භාෂාව තමාගේ මෙන් ම ජාතියේ ද සිය රටේ ද උරුමයක් බව තහවුරු කිරීම
8. ත්‍රිපිටකය හැදෑරීම සඳහා පාලි භාෂාව මූලික අවශ්‍යතාවක් බව අවධාරණය කිරීම
9. ත්‍රිපිටකය හා අටුවා පරිශීලනය කරමින් ධර්මය නිවැරදිව අර්ථකථනය කරන භික්‍ෂු පිරිසක් සාසනයට දායාද කිරීම
10. ත්‍රිපිටක බුද්ධවචනය නිවැරදි ව ග්‍රහණය කිරීම පිණිස ඇති ඒකායන මාර්ගය පාලි භාෂාව ඉගෙනීම බව පසක් කිරීම
11. බුද්ධවචනය සුරක්ෂිතව ඉදිරියට පවත්වාගෙන යාමට ප්‍රතිබල සම්පන්න උතුමන් පිරිසක් බිහි කිරීම
12. මහාවිහාරීය භික්ෂු සම්ප්‍රදාය විසින් සුරක්ෂිත කරන ලද විශිෂ්ට ඥාන සම්භාරය නො නසා ආරක්ෂා කිරීම
13. ජාත්‍යන්තර භාෂාවක් වශයෙන් පාලි භාෂාව භාවිත කිරීම සඳහා සිසුන් යොමු කිරීම
14. පාලි භාෂාව ඉගෙනීමෙන් තමන්ටත් සිව්පසය සපයන දායක පිරිසටත් මෙලොව පරලොව සුභසිද්ධිය ළඟා කරවාගත හැකි බව තහවුරු කිරීම

# විෂය හැඳින්වීම

ථේරවාදී බුදුදහම යන වදනට නියම වශයෙන් සාධාරණයක් ඉටු කෙරෙනුයේ පාලි භාෂාව මගිනි. මුල් බුදුසමය ලෙස සැලකෙන බෞද්ධ ඉගැන්වීම් රාශිය අප සතුව ඇත්තේ පාලි භාෂා මාධ්‍යයෙනි. එදිනෙදා සන්නිවේදන කාර්යයෙන් දුරස්ථ වූ පමණින් පාලි භාෂාව ව්‍යවහාරයේ නැතැයි කීම මුසාවකි. එසේම ම 'පාලි භාෂාව මළ බසකි' යැයි කීම ද පාලි භාෂාව පිළිබඳ අවිඥයින්ගේ මුග්ධ ප්‍රකාශයකි. මිනිසාගේ උපතේ සිට මරණය දක්වා දිවා රෑ දෙකෙහි අවබෝධයෙන් මෙන් ම අනවබෝධයෙන් ද මෙම භාෂාව භාවිත කරනු දක්නට ලැබේ. වර්තමානය වන විට දේශීය මෙන් ම විදේශීය වශයෙන් ද උසස් අධ්‍යාපන ආයතනයන්හි එදිනෙදා සන්නිවේදන කාර්යයන් සඳහා පාලි භාෂාව යොදා ගැනීමට උත්සහ කරනු දැකීම සතුටට කාරණයකි.

ලොව පවතින භාෂාවන් අතර පාලි භාෂාව වූ කලී ඉතා සරල හා සුගම භාෂාවකි. කන වැකෙන එම භාෂාවෙහි ශබ්ද මිහිරි ය. අර්ථවත් ය. අසභ්‍ය වචන කිසිවක් නැත. පුද්ගල සුචරිතය මගින් සදාතනික සැනසීම ළඟා කරවන ලොව ඇති සුවිශේෂීතම භාෂාව ලෙස පාලි භාෂාව අගය කළ හැකිය. පාලිය උගත් තැනැත්තා පරිපූර්ණ පෞරුෂයකින් හෙබි පුද්ගලයෙක් වේ. එවන් නිර්මාණශීලී පුද්ගලයෙකු බිහි කිරීමෙහි ලා ප්‍රමුඛත්වයක් ගනු ලබන්නේ පාලි සාහිත්‍යාගත ආචාරධර්ම පද්ධතිය පුද්ගලයාගේ චර්යාමය වෙනසක් ඇති කිරීමට සමත් වන බැවිනි.

ත්‍රිපිටකය, අටුවා, ටීකා, ටිප්පණී, ප්‍රකරණාදී සාහිත්‍යාංග සමුදායත්, ඓතිහාසික වටිනාකමකින් යුත් වංසකථා සමූහයත් ඇතුළත් විවිධ වටිනාකමින් යුත් ග්‍රන්ථ සමුදායක් පාලි සාහිත්‍යය හොබවයි. ථේරවාදී බුදුසමය මැනවින් විග්‍රහ කර ගැනීමට උක්ත සාහිත්‍ය ග්‍රන්ථ සමූහය පරිශීලනය කිරීම අත්‍යවශ්‍ය වේ.

ථේරවාදී බුදුසමය පිළිබඳ අවධානය විශ්වීය වශයෙන් යොමු වූ කාල පරිච්ඡේදයක් ලෙස වර්තමානය සැලකිය හැකි ය. ථේරවාදී බුදුසමයෙහි කේන්ද්‍රස්ථානය ශ්‍රී ලංකාව වීම නිසා ලෝකවාසී ජනතාවගේ ඇස ශ්‍රී ලංකාව වෙත තීව්‍ර ලෙස යොමු වී ඇත. පර්යාප්ති ශාසනය දිවිහිමියෙන් රැක්කෝ නම් ශ්‍රී ලාංකිකයෝ ය. වර්තමාන ශ්‍රී ලාංකික භික්ෂූන් වහන්සේට ලෝක ජනතාව ගරු කරනුයේ එබැවිනි. එම ගරුත්වයට සරිලන දැනුම, ආකල්ප, කුසලතා පිරි භික්ෂුවක් නිර්මාණය කිරීමේ කාර්යය පැවරී ඇත්තේ 'පිරිවෙණ' වෙත ය. එයිනුදු පාලි භාෂා විෂයභාර ගුරු භවතා සුවිශේෂ වේ. ථේරවාදී බුදුසමයේ ද පාලි භාෂාවේ ද භික්ෂූන් වහන්සේගේ ද මුලු මහත් සම්බුද්ධ ශාසනයේ ද අනාගත පැවැත්ම ඇත්තේ පාලි භාෂා ගුරුවරයා මත ය යැයි සැලකීම නිරවද්‍ය හා යථාර්ථමය සංසිද්ධියක් වේ.

පිරිවෙන් ශිෂ්‍යයන් තුළ පාලි භාෂා ඥානය විධිමත් කිරීම සඳහා කළයුතු වූ සුවිශේෂී කාර්යය නො පිරිහෙලා ඉටු කෙරෙයි නම් සම්බුද්ධ ශාසනයෙහි චිරස්ථිතිය සඳහා ඉමහත් පිටුවහලක් වනු ඇත.

**පූජ්‍ය බණ්ඩාරවෙල රතනසාර හිමි,**
පාලි විෂය උපදේශක (පිරිවෙන්),
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව,
අධ්‍යාපන අමාත්‍යාංශය.

# නිපුණතා ළඟාකරවීමට වර්ෂයකට යෝජිත කාලච්ඡේද ප්‍රමාණයන්

| නිපුණතාව \ ශ්‍රේණිය | 01 | 02 | 03 | 04 | 05 | එකතුව |
|---|---|---|---|---|---|---|
| 01. පාලි අක්ෂර මාලාව ප්‍රභේද ගත කරයි. | **30** | **25** | **10** | **12** | **05** | **82** |
| 02. පාලි නාමපද විභක්ත්‍යර්ථ පිළිබඳ අවබෝධයෙන් භාවිත කරයි. | **20** | **25** | **10** | **12** | **15** | **82** |
| 03. විවිධ ආඛ්‍යාත ප්‍රභේද උචිත පරිදි භාවිත කරයි. | **25** | **25** | **15** | **10** | **15** | **90** |
| 04. පාලි භාෂා රීතියට අනුව වාක්‍ය රචනා කරයි. | **35** | **30** | **15** | **12** | **10** | **102** |
| 05. නිවැරදි වියරණ විධි සහිත ව පරිවර්තන කාර්යයේ යෙදෙයි. | **25** | **25** | **15** | **16** | **15** | **96** |
| 06. නිර්දිෂ්ට පාලි පාඨ හා වරනැගීම් වාචෝද්ගත කරයි. | **40** | **40** | **25** | **25** | **10** | **140** |
| 07. පාලි භාෂාවේ සන්ධි හඳුනාගෙන භාවිත කරයි. | **----** | **05** | **12** | **10** | **10** | **37** |
| 08. පාලි භාෂාවේ සමාස හඳුනාගෙන භාවිත කරයි. | **----** | **----** | **06** | **07** | **10** | **23** |
| 09. පාලි භාෂාවේ තද්ධිත හඳුනාගෙන භාවිත කරයි. | **----** | **----** | **06** | **07** | **10** | **23** |
| 10. පාලි භාෂාවේ කිතක හඳුනාගෙන භාවිත කරයි. | **----** | **----** | **06** | **07** | **10** | **23** |
| 11. නිර්දිෂ්ට ගද්‍ය පද්‍ය පාඨ පරිවර්තනය සඳහා කියවයි. | **----** | **----** | **30** | **32** | **34** | **96** |
| 12. පාලි සාහිත්‍යයේ සුවිශේෂ චරිත හඳුනාගෙන චරිතායනය කරයි. | **----** | **----** | **----** | **----** | **06** | **06** |
| **එකතුව** | **175** | **175** | **150** | **150** | **150** | **800** |

# මූලික ශ්‍රේණියට පාලි විෂය ඉගැන්වීම සඳහා උපදෙස්

**අක්ෂර :-**
- අක්ෂරමාලාව අනුපිළිවෙළින් කියවීම
- නිවැරදි උච්චාරණයට හුරුකිරීම
- මතකයෙන් කීම හා නිවැරදි ව මතකයෙන් ලිවීම සඳහා පුහුණු කිරීම
- ස්වර හා ව්‍යඤ්ජන වශයෙන් අක්ෂරමාලාව ප්‍රභේද ගත කිරීම
- ව්‍යඤ්ජනාක්ෂර ස්වභාවයෙන් ම හල්වන බවත් ස්වර අට එකතු වී හල්බව නැති වී ව්‍යඤ්ජනාක්ෂර නිපදවන ආකාරයත් පුහුණු කිරීම

**නාමපද :-**
- සරල නාමපද මාලාවක් අර්ථ සහිත ව වාචෝද්ගත කිරීම
- ඒකවචන හා බහුවචන වශයෙන් වෙන් කිරීම (පඨමා විභක්ති රූප පමණක්) (නාමපද මාලාව තෝරාගැනීම සඳහා **පාලි භාෂාවතරණය I** පොතෙහි අභ්‍යාස 01න් හා 02න් අකාරාන්ත පුල්ලිංග **පුරිස ශබ්දය** හා සමාන ශබ්ද මාලාව යෝග්‍ය වේ. තව ද නාමපද 50 ක් පමණ සෑහෙන අතර ඊට වඩා ආයාසයකින් තොර ව පුහුණු කරවාගත හැකි නම් ඉදිරි ශ්‍රේණිවල දී ගුරුවරයාට පහසුවක් වනු ඇත. දෙනු ලබන නාමපද මාලාවෙහි නිවැරදි අක්ෂර වින්‍යාසය පුහුණු කිරීම සුදුසු ය.)

**ආඛ්‍යාත පද :-**
- වර්තමාන කාලික පඨමපුරිස ක්‍රියාපද මාලාවක් ලබා දී, ඒවා ඒකවචන හා බහුවචන වශයෙන් වෙන් කිරීම (එම ක්‍රියාපද මාලාව තෝරා ගැනීම සඳහා **පාලි භාෂාවතරණය I** පොතෙහි තෙවන අභ්‍යාසයට අදාළ ක්‍රියාපද මාලාවත් ඊට අමතරව ගුරුවරයාට අභිමත සහ සිසුන්ට ගැළපෙන ක්‍රියාපද තෝරා ගැනීමත් සුදුසු ය. තව ද දෙනු ලබන ආඛ්‍යාතපද මාලාවෙහි නිවැරදි අක්ෂර වින්‍යාසය පුහුණු කිරීම සුදුසු ය.)

**වාක්‍ය :-**
- නාමපද හා ක්‍රියාපද මාලාව ඇසුරින් උක්තය හා ආඛ්‍යාතය පමණක් ඇති සරල වාක්‍ය නිර්මාණය කරවීම
- ඒකවචන හා බහුවචන වාක්‍ය නිර්මාණය කිරීමට පුහුණු කරවීම
- පද බෙදීම හා නිවැරදි හැඩයෙන් යුතු අකුරු ලිවීමට පුහුණු කිරීම

**පිරුවානා පොත් වහන්සේ :-**
- **සරණාගමනය, දසසික්ඛාපද, සාමණේරපඤ්හ, ද්වත්තිංසාකාර, පච්චවෙක්ඛණා, දසධම්මසුත්ත** යන පිරිත් සූත්‍ර වණපොත් කිරීම හා නිවැරදි උච්චාරණය සඳහා පුහුණු කිරීම
- ගණ සජ්ඣායනය හෙවත් සාමූහික ව මතකයෙන් පිරිත් සජ්ඣායනය කිරීම මගින් සිසුන්ගේ මතක ශක්තිය වර්ධනය කිරීමට කටයුතු සැලසීම.

**නිර්දිෂ්ට ග්‍රන්ථ :- පාළි - සිංහල පිරිත් පොත; කිරිවත්තුඩුවේ ශ්‍රී ප්‍රඥාසාර නාහිමි, (ඇස් ගොඩගේ සහ සහෝදරයෝ)**

# 01 ශ්‍රේණිය - පාලි විෂය නිර්දේශය

න තෙන පණ්ඩිතො හොති - යාවතා බහුභාසති,
ඛෙමී අවෙරී අභයො - පණ්ඩිතො'ති පවුච්චති.

(යමෙක් බොහෝ සෙයින් කතා කළ පමණින් පණ්ඩිතයෙක් නො වේ.
ඉවසන සුළු, වෛර නැති, බිය නැති, අනුන්ට කරදර නොකරන
පුද්ගලයා පණ්ඩිතයෙකැ'යි කියනු ලැබේ.)

- ධම්මපද -

# 01 ශ්‍රේණිය - පාලි විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 01. පාලි අක්ෂර මාලාව ප්‍රභේද ගත කරයි. | 1.1 පාලි අක්ෂර මාලාව පිළිවෙළින් ලියා ස්වර හා ව්‍යඤ්ජන වශයෙන් ප්‍රභේද කොට ස්වර ප්‍රභේද දක්වයි.<br>1.2 ව්‍යඤ්ජන අක්ෂරවලට ස්වරාරූඪ කර ලියයි.<br>1.3 ස්වරාරූඪ අක්ෂරවල ස්වර හා ව්‍යඤ්ජන වෙන්කර ලියයි. | • අක්ෂර මාලාව<br>• ස්වරාක්ෂර<br>• ව්‍යඤ්ජනාක්ෂර<br>• හ්‍රස්වාක්ෂර<br>• දීර්ඝාක්ෂර<br>• ව්‍යඤ්ජන ස්වරාරූඪ කිරීම | • පාලි අක්ෂර මාලාව නිවැරදි ව උච්චාරණය කරයි.<br>• පාලි අක්ෂර මාලාව නිවැරදි ව පිළිවෙළින් ලියයි.<br>• ස්වර ලියා දක්වයි.<br>• ව්‍යඤ්ජන ලියා දක්වයි.<br>• ස්වර ප්‍රභේද වෙන්කොට දක්වයි.<br>• ව්‍යඤ්ජනාක්ෂරවලට ස්වරාරූඪ කර ලියයි.<br>• අක්ෂරවල ස්වර හා ව්‍යඤ්ජන වෙන් කොට දක්වයි.<br>• වචනවල ස්වර හා ව්‍යඤ්ජන වෙන් කර ලියයි. | 30 |
| 02. පාලි නාමපද විභක්ත්‍යර්ථ පිළිබඳ අවබෝධයෙන් භාවිත කරයි. | 2.1. විවිධ ස්වරාන්ත ශබ්ද කිහිපයක් වරනගයි.<br>2.2 විභක්ත්‍යර්ථ දක්වයි.<br>2.3 වාක්‍ය නිර්මාණයේ දී හා පරිවර්තනයේ දී විභක්ත්‍යර්ථ භාවිත කරයි.<br>2.4 සමාන ශබ්ද වරනගයි. | • පුල්ලිංග - බුද්ධ ශබ්දය<br>• ඉත්ථිලිංග - කඤ්ඤා ශබ්දය<br>• නපුංසකලිංග - ඵල ශබ්දය විභක්ත්‍යර්ථ සහිත ව | • නිර්දිෂ්ට ශබ්ද නිවැරදි ව මතකයෙන් වරනගා දක්වයි.<br>• කිසියම් විභක්තියකට අයත් පද ලියා දක්වයි.<br>• නිර්දිෂ්ට ශබ්දවලට හෝ ඒ හා සමාන වරනැගෙන ශබ්දවලට සිංහලාර්ථ සපයයි.<br>• නිර්දිෂ්ට ශබ්ද හා සමාන ශබ්ද වරනගා අර්ථ ගන්වයි. | 20 |
| 03. විවිධ ආඛ්‍යාත ප්‍රභේද උචිත පරිදි භාවිත කරයි. | 3.1 පුරුෂ හා වචන භේදය හඳුනාගනිමින් ආඛ්‍යාත කිහිපයක් වරනගයි.<br>3.2 ලේඛනයේ දී ආඛ්‍යාත පද නිවැරදි ව භාවිත කරයි.<br>3.3 ආඛ්‍යාත කිහිපයක් උභය පදයෙහි වරනගා අර්ථ ගන්වයි. | • වත්තමානා ආඛ්‍යාතය<br>• භවිස්සන්ති ආඛ්‍යාතය | • නියමිත ආඛ්‍යාත වගුගත කර ලියා දක්වයි.<br>• ආඛ්‍යාත මතකයෙන් කියයි; ලියා දක්වයි.<br>• පුරුෂ භේදය හා වචන භේදය අනුව ආඛ්‍යාත පදවලට සිංහලාර්ථ සපයයි.<br>• වර්තමාන කාල වාක්‍ය අනාගත කාලයෙනුත් අනාගත කාල වාක්‍ය වර්තමාන කාලයෙනුත් ලියා දක්වයි.<br>• ධාතු කිහිපයක් වත්තමානා හා භවිස්සන්ති ආඛ්‍යාතවල උභයපදයෙහි වරනගයි. | 25 |

| | | | | |
|---|---|---|---|---|
| 04. පාලි භාෂා රීතියට අනුව වාක්‍ය රචනා කරයි. | 4.1 උක්ත ආඛ්‍යාත පද පමණක් ඇති සරල වාක්‍ය නිර්මාණය කරයි.<br>4.2 ඒකවචන වාක්‍ය බහුවචනයටත් බහුවචන වාක්‍ය ඒකවචනයටත් හරවා ලියයි.<br>4.3 සරල වාක්‍ය නිර්මාණය කොට කාල භේදය අවබෝධ කර ගනිමින් වර්තමාන කාල වාක්‍ය අනාගතයටත් අනාගත කාල වාක්‍ය වර්තමානයටත් හරවා ලියයි. | ● පඨමා විභක්ති පද<br>● වර්තමාන කාල ආඛ්‍යාත පද<br>● අනාගත කාල ආඛ්‍යාත පද | ● අකාරාන්ත පුල්ලිංග ශබ්දවල පඨමා විභක්තිය නිවැරදි ව අර්ථ ගන්වයි.<br>● උක්ත පද හා වර්තමාන ආඛ්‍යාත පමණක් ඇති සරල වාක්‍ය ලියා දක්වයි.<br>● ඒකවචන වාක්‍ය බහුවචනයට හරවා ලියයි.<br>● බහුවචන වාක්‍ය ඒකවචනයට හරවා ලියයි.<br>● ආඛ්‍යාත පදය වෙනස් කරමින් වර්තමාන කාල හා අනාගත කාල වාක්‍ය නිර්මාණය කරයි. | 35 |
| 05. නිවැරදි ව්‍යාකරණ විධි සහිත ව පරිවර්තන කාර්යයේ යෙදෙයි. | 5.1 උක්තාඛ්‍යාත පමණක් ඇති වාක්‍ය මාධ්‍ය භාෂාවට නගයි.<br>5.2 මාධ්‍ය භාෂාගත සරල වාක්‍ය පාලි භාෂාවට නගයි. | ● වර්තමාන කාල සරල වාක්‍ය<br>● අනාගත කාල සරල වාක්‍ය | ● සරල පාලි වාක්‍ය සිංහලයට නගයි.<br>● සරල සිංහල වාක්‍ය පාලියට නගයි.<br>● ඒකවචන වාක්‍ය බහුවචනයට හරවා ලියයි.<br>● බහුවචන වාක්‍ය ඒකවචනයට හරවා ලියයි.<br>● වර්තමාන කාල වාක්‍ය අනාගත කාලයට හරවා ලියයි.<br>● අනාගත කාල වාක්‍ය වර්තමාන කාලයට හරවා ලියයි. | 25 |
| 06. නිර්දිෂ්ට පාලි පාඨ හා වරනැගීම් වාචෝද්ගත කරයි. | 6.1 නිර්දිෂ්ට පාලි පාඨ හා වරනැගීම් මතකයෙන් කියයි.<br>6.2 නිර්දිෂ්ට පාලි පාඨ හා වරනැගීම් නිවැරදි ව ලියා දක්වයි.<br>6.3 නිර්දිෂ්ට පාලි පාඨ හා සූත්‍ර ගණ සජ්ඣායනය කරයි. | ● තුන් සූත්‍රය<br>● අටවිසි පිරිත<br>● මහා ජයමංගල ගාථා<br>★ **ඛන්ධ පිරිත** ★ **මෝර පිරිත**<br>★ **සූරිය පිරිත** ★ **චන්ද පිරිත**<br>★ **මෙත්තානිසංස සූත්‍රය**<br>● බුද්ධ, කඤ්ඤා, ඵල යන ශබ්ද<br>● වත්තමානා හා භවිස්සන්ති ආඛ්‍යාත | ● නිර්දිෂ්ට පාඨ හා වරනැගීම් නිවැරදි ව කියවයි.<br>● මතකයෙන් ලියයි; කියයි.<br>● ගණ සජ්ඣායනය කරයි.<br>● පිරිත් පාඨ හා ගාථා නිවැරදි ව සජ්ඣායනා කරයි. | 40 |

නිර්දිෂ්ට ග්‍රන්ථ :- පාලි භාෂාව - 1 ශ්‍රේණිය - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
පාළි - සිංහල පිරිත් පොත - කිරිවත්තුඩුවේ ශ්‍රී ප්‍රඥාසාර නාහිමි
පාළි නාම වරනැගිල්ල - හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි
★ **තද කළු අකුරින් මුද්‍රිත කොටස් ගණ සජ්ඣායනය සඳහා පමණි.**

# 02 ශ්‍රේණිය - පාලි විෂය නිර්දේශය

අඤ්ඤා හි ලාභූපනිසා - අඤ්ඤා නිබ්බාණගාමිනී,
එවමෙතං අභිඤ්ඤාය - භික්ඛු බුද්ධස්ස සාවකො,
සක්කාරං නාභිනන්දෙය්‍ය - විවෙකමනුබ්‍රෑහයෙ.

(ලාභ උපදවන පිළිවෙළ අනෙකක් ම ය. නිවන් යන පිළිවෙත අනෙකක් ම ය.
මෙසේ මේ කාරණය විශේෂයෙන් දැන බුද්ධශ්‍රාවක වූ මහණ තෙම අධාර්මික සත්කාරය නො පතන්නේ ය. විවේකය වඩන්නේ ය.)

- ධම්මපද -

# 02 ශ්‍රේණිය - පාලි විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 01<br>පාලි අක්ෂර මාලාව ප්‍රභේද ගත කර භාවිත කරයි. | 1.1 පාලි අක්ෂර මාලාව පිළිවෙළින් ලියා දක්වයි.<br>1.2 එ කාරයේ හා ඔ කාරයේ නිවැරදි භාවිතය පෙන්වා දෙයි.<br>1.3 ව්‍යඤ්ජන ප්‍රභේද නම් කර ඒ ඒ ප්‍රභේදයට අයත් අක්ෂර ලියා දක්වයි. | • අක්ෂර 41<br>• එ කාර ඔ කාර භාවිතය<br>• වර්ගාක්ෂර<br>• වර්ගාන්තාක්ෂර<br>• අවර්ගාක්ෂර<br>• නිග්ගහීතය | • පාලි අක්ෂර මාලාව නිවැරදි ව පිළිවෙළින් ලියයි.<br>• පාලි අක්ෂර මාලාවේ ස්වර ව්‍යඤ්ජන වෙන් කර ලියයි.<br>• එ කාරයේ හා ඔ කාරයේ නිවැරදි ලේඛනය හා උච්චාරණය දක්වයි.<br>• එ කාරය හා ඔ කාරය හ්‍රස්ව ව යෙදුණු වචන ලියයි.<br>• එ කාරය හා ඔ කාරය දීර්ඝ ව යෙදුණු වචන ලියයි.<br>• ව්‍යඤ්ජන ප්‍රභේද නම් කරයි.<br>• ඒ ඒ ව්‍යඤ්ජන ප්‍රභේදය හඳුන්වයි.<br>• ඒ ඒ ප්‍රභේදයට අයත් අක්ෂර ලියා දක්වයි.<br>• නම් කරනු ලබන අක්ෂරයක හෝ කිහිපයක ස්වර හෝ ව්‍යඤ්ජන ප්‍රභේදය ලියා දක්වයි.<br>• නිග්ගහීතය යෙදුණු වචන ලියා දක්වයි. | 25 |
| 02.<br>පාලි නාමපද විභක්ත්‍යර්ථ පිළිබඳ අවබෝධයෙන් භාවිත කරයි. | 2.1. ශබ්දාන්ත වශයෙන් නාම වරනැගීම වෙනස් වන බව තේරුම් ගනියි.<br>2.2 ලිංග භේදය අනුව නාම වරනැගීම් වෙනස් වන බව පැහැදිලි කරයි.<br>2.3 ඇතැම් අකාරාන්ත ශබ්ද විශේෂ ලෙස වරනැගෙන බව පෙන්වා දෙයි. | • පුල්ලිංග - අත්ත, රාජ, අග්ගි, භික්ඛු ශබ්ද<br>• ඉත්ථිලිංග - නදී ශබ්දය<br>• නපුංසකලිංග - චිත්ත ශබ්දය | • නිර්දිෂ්ට ශබ්ද නිවැරදි ව මතකයෙන් ලියයි.<br>• නිර්දිෂ්ට ශබ්ද නිවැරදි ව වරනගයි.<br>• නිර්දිෂ්ට ශබ්දවල පදයන්හි විභක්තිය හා වචනය ලියා දක්වයි.<br>• ඒ ඒ පදවලට මාධ්‍ය භාෂාවෙන් අර්ථ ලියයි.<br>• විශේෂ අකාරාන්ත ශබ්ද බුද්ධ ශබ්දය හා සසඳමින් වරනගා දක්වයි. | 25 |

| | | | | |
|---|---|---|---|---|
| 03. විවිධ ආඛ්‍යාත ප්‍රභේද උචිත පරිදි භාවිත කරයි. | 3.1 පුරුෂ හා වචන භේදය හඳුනා ගනිමින් ආඛ්‍යාත කිහිපයක් වරනගයි.<br>3.2 ලේඛනයේ දී ආඛ්‍යාත පද නිවැරදි ව භාවිත කරයි.<br>3.3 ආඛ්‍යාත කිහිපයක් උභයපදයෙහි වරනගයි.<br>3.4 පුරුෂ හා වචන භේදය තේරුම් ගනිමින් ආඛ්‍යාත පදවලට අර්ථ ලියයි. | • වත්තමානා ආඛ්‍යාතය<br>• භවිස්සන්ති ආඛ්‍යාතය<br>• අජ්ජතනී ආඛ්‍යාතය<br>• පඤ්චමී ආඛ්‍යාතය | • නියමිත ආඛ්‍යාතයන්හි ප්‍රත්‍යය මාලා ලියා දක්වයි.<br>• නියමිත ආඛ්‍යාත කාල, පද, පුරුෂ හා වචන වශයෙන් වගු ගත කර දක්වයි.<br>• ඒ ඒ ආඛ්‍යාත පදවලට මාධ්‍ය භාෂාවෙන් අර්ථ ලියයි.<br>• වාක්‍යයන්හි ආඛ්‍යාතය වෙනස් කොට වාක්‍ය කාලත්‍රයට හරවා ලියයි.<br>• නියමිත ආඛ්‍යාත උභයපදයෙහි වරනගා දක්වයි.<br>• ආඛ්‍යාත පද නිවැරදි ව යොදා වාක්‍ය සකසයි. | 25 |
| 04. පාලි භාෂා රීතියට අනුව වාක්‍ය රචනා කරයි. | 4.1 සරල පාලි වාක්‍යවල උක්තාඛ්‍යාත සම්බන්ධය පැහැදිලි කරයි.<br>4.2 කර්තෘ, කර්ම හා ක්‍රියා සහිත වාක්‍ය ලියයි.<br>4.3 සරල වාක්‍ය කාලත්‍රයට හරවා ලියයි. | • පඨමා, දුතියා විභක්ත්‍යර්ථ<br>• ත්‍රෛකාලික ක්‍රියා<br>• උක්තාඛ්‍යාත පද සම්බන්ධය | • උක්ත ආඛ්‍යාත පමණක් ඇති සරල පාලි වාක්‍ය නිර්මාණය කරයි.<br>• කර්ම පද එක් කරමින් දිගු වාක්‍ය ලියයි.<br>• වාක්‍ය කාලත්‍රයට හරවා ලියයි.<br>• උක්තාඛ්‍යාත සහිත ඒකවචන වාක්‍ය බහුවචනයට හරවා ලියයි. | 30 |
| 05. නිවැරදි වියරණ විධි සහිත ව පරිවර්තන කාර්යයේ යෙදෙයි. | 5.1 උක්තය, කර්මය හා ආඛ්‍යාතය සහිත වාක්‍ය මාධ්‍ය භාෂාවට නගයි.<br>5.2 මාධ්‍ය භාෂාගත කර්තෘ, කර්ම, ක්‍රියා සහිත වාක්‍ය පාලි භාෂාවට නගයි.<br>5.3 වාක්‍ය කාලත්‍රයට හරවා අර්ථ ගන්වයි. | • වර්තමාන කාල කර්තෘ, කර්ම, ක්‍රියා සහිත වාක්‍ය<br>• අනාගත කාල කර්තෘ, කර්ම, ක්‍රියා සහිත වාක්‍ය<br>• අතීත කාල කර්තෘ, කර්ම, ක්‍රියා සහිත වාක්‍ය | • සරල පාලි වාක්‍ය මාධ්‍ය භාෂාවට නගයි.<br>• මාධ්‍ය භාෂාගත සරල වාක්‍ය පාලි භාෂාවට නගයි.<br>• සරල පාලි වාක්‍ය කාලත්‍රයට හරවා ලියා දක්වා මාධ්‍ය භාෂාවට නගයි. | 25 |

| | | | | |
|---|---|---|---|---|
| **06.**<br>**නිර්දිෂ්ට පාලි පාඨ හා වරනැගීම් වාචෝද්ගත කරයි.** | 6.1 නිර්දිෂ්ට පාලි පාඨ, ගාථා හා සූත්‍ර වාචෝද්ගත කරයි.<br>6.2 නිර්දිෂ්ට පාලි පාඨ, ගාථා හා සූත්‍ර නිවැරදි ව ලියා දක්වයි.<br>6.3 නිර්දිෂ්ට ශබ්ද වරනගා නිවැරදි ව ලියා දක්වයි.<br>6.4 ගාථා හා සූත්‍ර ගණ සජ්ඣායනය කරයි. | ★ **මිත්තානිසංස පිරිත**<br>★ **කස්සපත්ථෙර බෝජ්ඣංග**<br>★ **චුන්දත්ථෙර බෝජ්ඣංග**<br>★ **ධජග්ග පිරිත**<br>• ඇණවුම් පිරිත<br>• අංගුලිමාල පිරිත<br>• ජය පිරිත<br>• ජිනපඤ්ජරය<br>———<br>• අත්ත, රාජ, ගුණවන්තු, චිත්ත, නදී ශබ්ද<br>• වත්තමානා, හවිස්සන්ති හා අජ්ජතනී ආඛ්‍යාත<br>• බාලාවතාරය - සඤ්ඤා කාණ්ඩය | • නිර්දිෂ්ට පාඨ, සූත්‍ර, පිරිත් හා වරනැගීම් නිවැරදි ව මතකයෙන් කියයි.<br>• අදාළ කොටස් නිවැරදි ව ලියා දක්වයි.<br>• පිරිත් සූත්‍ර ගණ සජ්ඣායනය කරයි. | 40 |
| **07.**<br>**පාලි භාෂාවේ සන්ධි හඳුනාගෙන භාවිත කරයි.** | 7.1 පාලි භාෂාවේ සන්ධි හඳුන්වා දෙයි.<br>7.2 සන්ධි ප්‍රභේද නම් කරයි.<br>7.3 නිර්දිෂ්ට ග්‍රන්ථවල ඇති සන්ධි පද උපුටා දක්වයි. | • සන්ධි හඳුනා ගැනීම<br>• ස්වර සන්ධි<br>• ව්‍යඤ්ජන සන්ධි<br>• නිග්ගහීත සන්ධි<br>• නිර්දිෂ්ට කෘතිවල ඇති | • සන්ධි යනු මොනවා දැයි හඳුන්වා දෙයි.<br>• පාලි සන්ධි පද උපුටා දක්වයි.<br>• සන්ධි ප්‍රභේද නම් කරයි.<br>• නිර්දිෂ්ට කෘතිවලින් සන්ධි පද උපුටා ලියයි. | 05 |

නිර්දිෂ්ට ග්‍රන්ථ :- පාලි භාෂාව - 2 ශ්‍රේණිය - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

★ තද කළු අකුරින් මුද්‍රිත කොටස් ගණ සජ්ඣායනය සඳහා පමණි.

# 03 ශ්‍රේණිය - පාලි විෂය නිර්දේශය

සද්ධා අභිනික්ඛම්ම - නවපබ්බජිතො නවො,
සඞ්ඝස්මිං විහරං භික්ඛු - සික්ඛෙථ විනයං බුධො.

(ශ්‍රද්ධාවෙන් ගිහිගෙයින් නික්ම අලුතින් පැවිදි වූ සංඝයා අතරෙහි වසන නුවණැති නවක භික්ෂුව විනය උගත යුතු ය.)

- උපාලිත්ථෙරගාථා -

# 03 ශ්‍රේණිය - පාලි විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 01. පාලි අක්ෂර මාලාව ප්‍රභේද ගත කර භාවිත කරයි. | 1.1 පාලි අක්ෂර මාලාව පිළිවෙළින් ලියා ප්‍රභේද කර දක්වයි.<br>1.2 පාලි පද අකාරාදි පිළිවෙළට සකස් කරයි. | • අක්ෂර 41<br>• ස්වර හා ව්‍යඤ්ජන<br>• ඝෝෂ<br>• අඝෝෂ<br>• අල්පප්‍රාණ<br>• මහාප්‍රාණ<br>• අන්තඃස්ථ<br>• අකාරාදි පිළිවෙළ | • පාලි අක්ෂර මාලාව නිවැරදි ව පිළිවෙළින් ලියා දක්වයි.<br>• අල්පප්‍රාණ හා මහාප්‍රාණ නොබිඳ පාලි අක්ෂර මාලාව නිවැරදි ව කියවයි.<br>• ව්‍යඤ්ජන ප්‍රභේද ලියා දක්වයි.<br>• ඒ ඒ ව්‍යඤ්ජන ප්‍රභේදය හඳුන්වා ඊට අයත් අක්ෂර ලියයි.<br>• පාලි වචන අකාරාදි පිළිවෙළට ලියයි. | 10 |
| 02. පාලි නාමපද විභක්ත්‍යර්ථ පිළිබඳ අවබෝධයෙන් භාවිත කරයි. | 2.1 සත්ථු, පිතු හා මාතු ශබ්ද වරනගා සමවිෂමතා පෙන්වා දෙයි.<br>2.2 මන ශබ්දය නපුංසක ලිංගයේ වරනගා අර්ථ දක්වයි.<br>2.3 අම්හ, තුම්හ ශබ්ද වරනගා අර්ථ ගන්වයි.<br>2.4 ත, එත, ඉම ශබ්ද ත්‍රිලිංගයේ වරනගා දක්වයි. | • පුල්ලිංග - සත්ථු, පිතු ශබ්ද<br>• ඉත්ථිලිංග - මාතු ශබ්දය<br>• නපුංසකලිංග - මන ශබ්දය<br>• අම්හ, තුම්හ ශබ්ද<br>• ත ශබ්දය<br>• එත ශබ්දය<br>• ඉම ශබ්දය | • නිර්දිෂ්ට ශබ්ද වරනගා ලියා දක්වයි.<br>• ඒ ඒ පදවල විභක්තිය හා වචනය ලියා අර්ථ ගන්වයි.<br>• සර්වනාම ශබ්ද විශේෂ ලෙස යෙදෙන අයුරු පෙන්වා දෙයි.<br>• සර්වනාම ශබ්ද ලිංගත්‍රයේ වරනගා දක්වයි.<br>• කිසියම් පදයක (සර්වනාම) ලිංගය හා විභක්තිය ලියා අර්ථ ගන්වයි. | 10 |
| 03. විවිධ ආඛ්‍යාත ප්‍රභේද උචිත පරිදි භාවිත කරයි. | 3.1 ත්‍රෛකාලික ආඛ්‍යාත උභය පදයේ වරනගයි.<br>3.2 පඤ්චමී, සත්තමී, පරොක්ඛා, හීයත්තනී, ආඛ්‍යාත වරනගා අර්ථ ගන්වයි.<br>3.3 ආඛ්‍යාත ප්‍රත්‍යය මාලාව වගු ගත කර ලියා දක්වයි. | • වත්තමානා ආඛ්‍යාතය<br>• භවිස්සන්ති ආඛ්‍යාතය<br>• අජ්ජතනී ආඛ්‍යාතය<br>• පඤ්චමී ආඛ්‍යාතය<br>• සත්තමී ආඛ්‍යාතය<br>• පරොක්ඛා ආඛ්‍යාතය<br>• හීයත්තනී ආඛ්‍යාතය | • නියමිත ආඛ්‍යාතයන්හි ප්‍රත්‍යය මාලා මතකයෙන් ලියා දක්වයි.<br>• ඒ ඒ ආඛ්‍යාත වගු ගත කර ලියා දක්වයි.<br>• දෙනු ලබන ආඛ්‍යාත පදයක් කිනම් ආඛ්‍යාතයකට අයත් දැයි ලියා දක්වයි.<br>• ධාතු කිහිපයක් ඒ ඒ ආඛ්‍යාතවල වරනගන අන්දම වගු ගත කර දක්වයි. | 15 |

| | | | | |
|---|---|---|---|---|
| 04. පාලි භාෂා රීතියට අනුව වාක්‍ය රචනා කරයි. | 4.1 කර්තෘ, කර්ම හා ක්‍රියා සහිත වාක්‍ය කාලත්‍රයෙන් ලියයි.<br>4.2 උපසර්ග හා නිපාත පද යොදා දිගු වාක්‍ය රචනා කරයි. | ● කර්තෘ, කර්ම, ක්‍රියා සහිත වාක්‍ය<br>● ත්‍රෛකාලික ක්‍රියා<br>● නිපාත<br>● උපසර්ග | ● කර්තෘ, කර්ම හා ක්‍රියා සහිත සරල පාලි වාක්‍ය නිර්මාණය කර ලියයි.<br>● වර්තමාන කාල වාක්‍ය කාලත්‍රයෙන් ලියා දක්වයි.<br>● ඒකවචන වාක්‍ය බහුවචනයට හරවා ලියයි.<br>● සිංහල භාෂාවේ දී අප්‍රාණවාචී බහුවචන උක්ත පදයට ඒකවචනයෙන් ආඛ්‍යාතය යෙදුන ද පාලියේ දී එසේ නොවන බව හඳුනා ගනියි. | 15 |
| 05. නිවැරදි වියරණ විධි සහිත ව පරිවර්තන කාර්යයේ යෙදෙයි. | 5.1 කර්තෘ, කර්ම හා ක්‍රියා සහිත වාක්‍ය මාධ්‍ය භාෂාවට නගයි.<br>5.2 මාධ්‍ය භාෂාගත කර්තෘ, කර්ම, ක්‍රියා සහිත වාක්‍ය පාලි භාෂාවට නගයි.<br>5.3 උපසර්ග හා නිපාත පද යොදා වාක්‍ය අලංකාර ව දිගු කර ලියා මාධ්‍ය භාෂාවට නගයි.<br>5.4 සරල පාලි වාක්‍ය කාලත්‍රයට හරවා මාධ්‍ය භාෂාවට නගයි. | ● ත්‍රෛකාලික කර්තෘ, කර්ම, ක්‍රියා සහිත වාක්‍ය<br>● සවිභක්තික නිපාත පද | ● කාලත්‍රයට අයත් සරල පාලි වාක්‍ය මාධ්‍ය භාෂාවට නගයි.<br>● කාලත්‍රයට අයත් මාධ්‍ය භාෂාගත සරල වාක්‍ය පාලි භාෂාවට නගයි.<br>● වාක්‍ය කාලත්‍රයට හා ඒකවචන, බහුවචන දෙකට හරවමින් පරිවර්තනය කරයි.<br>● ඇතැම් නිපාතවලට අදාළ විභක්ති භාවිත කරයි. | 15 |
| 06. නිර්දිෂ්ට පාලි පාඨ හා වරනැගීම් වාචෝද්ගත කරයි. | 6.1 නිර්දිෂ්ට පාලි පාඨ, ගාථා සූත්‍ර හා වරනැගීම් වාචෝද්ගත කරයි.<br>6.2 නියමිත කොටස් නිවැරදිව ලියා දක්වයි.<br>6.3 ගාථා හා සූත්‍ර ගණ සජ්ඣායනය කරයි. | ● සතර කමටහන්<br>● අට්ඨසංවෙගවත්‍ථු<br>★ **ගිරිමානන්ද සූත්‍රය**<br>★ **ඉසිගිලි සූත්‍රය** ★ **පරාභව සූත්‍රය**<br>★ **වසල සූත්‍රය** ★ **ආලවක සූත්‍රය**<br>● නාම වරනැගීම<br>● සත්ථු, පිතු ශබ්ද<br>● මාතු ශබ්දය හා මන ශබ්දය<br>● අම්හ, තුම්හ, ත, එත, ඉම ශබ්ද<br>● ආඛ්‍යාත වරනැගීම<br>● වත්තමානා, භවිස්සන්ති,<br>● අජ්ජතනී, පඤ්චමී<br>● සත්තමී, පරොක්ඛා, හීයත්තනී<br>● බාලාවතාරය - සන්ධි කාණ්ඩය | ● නිර්දිෂ්ට පාලි පාඨ, සූත්‍ර, පිරිත් ගාථා හා වරනැගීම් නිවැරදි ව මතකයෙන් කියයි.<br>● අදාළ කොටස් මතකයෙන් නිවැරදි ව ලියා දක්වයි.<br>● සූත්‍ර හා පිරිත් ගණ සජ්ඣායනය කරයි.<br>● ගාථා පාඨ නිවැරදි ව සජ්ඣායනා කරයි. | 25 |

| | | | | |
|---|---|---|---|---|
| **07.**<br>**පාලි භාෂාවේ සන්ධි හඳුනාගෙන භාවිත කරයි.** | 7.1 පාලි භාෂාවේ සන්ධි හඳුන්වා සන්ධි ප්‍රයෝජන දක්වයි.<br>7.2 සන්ධි කාර්යය හඳුන්වා නිදසුන් සපයයි.<br>7.3 සන්ධි ප්‍රභේද නම් කොට නිදසුන් දෙමින් සන්ධි ප්‍රභේද කෙටියෙන් පැහැදිලි කරයි. | • සන්ධි හැඳින්වීම<br>• සන්ධි ප්‍රයෝජන<br>• සන්ධි කාර්ය<br>• සන්ධි ප්‍රභේද<br>• නිදර්ශන | • සන්ධි යනු මොනවා දැයි හඳුන්වයි.<br>• සන්ධි ප්‍රයෝජන ලියා දක්වයි.<br>• සන්ධි කාර්යය ලියා දක්වයි.<br>• ඒ ඒ සන්ධි කාර්යයට නිදසුන් සපයයි.<br>• සන්ධි ප්‍රභේද නම් කරයි.<br>• නිර්දිෂ්ට කෘතිවලින් සන්ධි පද උපුටා ලියයි.<br>• ඒ ඒ සන්ධි ප්‍රභේදය හඳුන්වා නිදසුන් සපයයි. | 12 |
| **08.**<br>**පාලි භාෂාවේ සමාස හඳුනාගෙන භාවිත කරයි.** | 8.1 සමාස කෙටියෙන් හඳුන්වයි.<br>8.2 සමාස ප්‍රයෝජන පෙන්වා දෙයි.<br>8.3 සමාස ප්‍රභේද නම් කරයි.<br>8.4 ඒ ඒ සමාස ප්‍රභේදය නිදසුන බැගින් සපයමින් කෙටියෙන් පැහැදිලි කරයි. | • සමාස හැඳින්වීම<br>• සමාස ප්‍රයෝජන<br>• සමාස ප්‍රභේද | • සමාස යනු මොනවා දැයි පැහැදිලි කරයි.<br>• සමාස ප්‍රයෝජන ලියා දක්වයි.<br>• සමාස ප්‍රභේද කර ලියා දක්වයි.<br>• ඒ ඒ ප්‍රභේදයට නිදසුන බැගින් සපයයි.<br>• සමාස ප්‍රභේදය කෙටියෙන් හඳුන්වයි. | 06 |
| **09.**<br>**පාලි භාෂාවේ තද්ධිත හඳුනාගෙන භාවිත කරයි.** | 9.1 තද්ධිත කෙටියෙන් හඳුන්වයි.<br>9.2 තද්ධිත ප්‍රභේද නම් කරයි.<br>9.3 ඒ ඒ ප්‍රභේදයට නිදසුන බැගින් සපයයි.<br>9.4 තද්ධිත ප්‍රයෝජන ලියා දක්වයි. | • තද්ධිත හැඳින්වීම<br>• තද්ධිත ප්‍රභේද<br>• තද්ධිත සඳහා නිදර්ශන සැපයීම<br>• තද්ධිත ප්‍රයෝජන | • තද්ධිත හඳුන්වා දෙයි.<br>• තද්ධිත ප්‍රභේද ලියා දක්වයි.<br>• ඒ ඒ තද්ධිත ප්‍රභේදයට නිදසුන බැගින් සපයයි.<br>• තද්ධිතවල ප්‍රයෝජන මොනවා දැයි පෙන්වා දෙයි. | 06 |
| **10.**<br>**පාලි භාෂාවේ කිතක හඳුනාගෙන භාවිත කරයි.** | 10.1 කිතක කෙටියෙන් හඳුන්වයි.<br>10.2 කිතක ප්‍රභේද නම් කරයි.<br>10.3 කිතක ප්‍රභේදවලට නිදසුන් සපයයි. | • කිතක හැඳින්වීම<br>• කිතක ප්‍රභේද නම් කිරීම<br>• ඒ ඒ ප්‍රභේදයට නිදර්ශන සැපයීම | • කිතක හඳුන්වා දෙයි.<br>• තද්ධිත හා කිතක අතර වෙනස පෙන්වා දෙයි.<br>• ඒ ඒ කිතක ප්‍රභේදයට නිදසුන් සපයයි. | 06 |

| | | | | |
|---|---|---|---|---|
| **11.<br>නිර්දිෂ්ට ගද්‍ය පද්‍ය පාඨ පරිවර්තනය සඳහා කියවයි.** | 11.1 අනිත්ථිගන්ධකුමාරවත්ථු මාධ්‍ය භාෂාවට නගයි.<br>11.2 අඤ්ඤතරබ්‍රාහ්මණවත්ථු මාධ්‍ය භාෂාවට නගයි.<br>11.3 පඤ්චසතදාරකවත්ථු මාධ්‍ය භාෂාවට නගයි. | • ධම්මපදට්ඨකථා - පියවග්ග<br>➢ අනිත්ථිගන්ධකුමාරවත්ථු<br>➢ අඤ්ඤතරබ්‍රාහ්මණවත්ථු<br>➢ පඤ්චසතදාරකවත්ථු | • නියමිත කථාවන්ට පදානුපදික අර්ථ ලියයි.<br>• කථා මාධ්‍යභාෂාවෙන් ලියා දක්වයි.<br>• කථා සාරය මතකයෙන් කියයි.<br>• නියමිත කථාවල ජීවනාදර්ශ පෙන්වා දෙයි. | 30 |

**නිර්දිෂ්ට ග්‍රන්ථ :- පාලි භාෂාව - 3 ශ්‍රේණිය - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව**

**★ තද කළු අකුරින් මුද්‍රිත කොටස් ගණ සජ්ඣායනය සඳහා පමණි.**

# 04 ශ්‍රේණිය - පාලි විෂය නිර්දේශය

අයං ච දහරො භික්ඛු - අයමුත්තමපොරිසො,
ධාරෙති අන්තිමං දෙහං - ජෙත්වා මාරං සවාහිනිං.

(මේ දහර (ළමා) භික්ෂුවකි. මොහු උතුම් පුරුෂයෙකි. සේනා සහිත වූ මාරයා පරාජය කොට අන්තිම දේහය දරයි.)

- මොග්ගල්ලානථෙරගාථා -

# 04 ශ්‍රේණිය - පාලි විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 01.<br>පාලි අක්ෂර මාලාව ප්‍රභේද ගත කර භාවිත කරයි. | 1.1 පාලි අක්ෂර මාලාව ප්‍රභේද කර ලියා දක්වයි.<br>1.2 අක්ෂර උත්පත්ති ස්ථාන හඳුන්වා ඊට අයත් අකුරු ලියයි. | • පාලි අක්ෂර මාලාව<br>• ස්වර ප්‍රභේද<br>• ව්‍යඤ්ජන ප්‍රභේද<br>• අක්ෂර උත්පත්ති ස්ථාන | • පාලි අක්ෂර මාලාව නිවැරදි ව පිළිවෙළින් ලියා දක්වයි.<br>• පාලි අක්ෂර මාලාව නිවැරදි ව කියවයි.<br>• පාලි අක්ෂර මාලාවේ ප්‍රභේද ලියා දක්වයි.<br>• අක්ෂර උත්පත්ති ස්ථාන නම් කරයි.<br>• ඒ ඒ ස්ථානයෙන් උපදින අකුරු ලියා වගු ගත කරයි.<br>• බාලාවතාර සූත්‍රානුසාරයෙන් අක්ෂර උත්පත්තිස්ථාන පැහැදිලි කරයි. | 12 |
| 02.<br>පාලි නාමපද විභක්ත්‍යර්ථ පිළිබඳ අවබෝධයෙන් භාවිත කරයි. | 2.1. නාම විභක්තිවල විභක්ත්‍යර්ථ පෙන්වා දෙයි.<br>2.2 නාම පද හා නාම විශේෂණ පද ලෙස භාවිත කරයි.<br>2.3 නියමිත ශබ්ද ලිංගත්‍රයේ වරනගයි. | • ගච්ඡන්ත ශබ්දය<br>• ගුණවන්තු ශබ්දය<br>• ත ශබ්දය<br>• එත ශබ්දය<br>• ඉම ශබ්දය<br>• කිං ශබ්දය | • නාම විභක්ති රූපවල අර්ථය ලියයි.<br>• නියමිත ශබ්ද නාම පද ලෙස වාක්‍යවල යොදයි.<br>• නියමිත ශබ්ද විශේෂණ පද ලෙස භාවිත කරයි.<br>• ලිංගත්‍රයේ වරනගා දක්වයි. | 12 |
| 03.<br>විවිධ ආඛ්‍යාත ප්‍රභේද උචිත පරිදි භාවිත කරයි. | 3.1 ත්‍රෛකාලික ආඛ්‍යාත වගු ගත කරයි.<br>3.2 පඤ්චමී හා සත්තමී ආඛ්‍යාත වරනගා අර්ථ ගන්වයි.<br>3.3 හීයත්තනී, පරොක්ඛා, කාලාතිපත්ති ආඛ්‍යාත උභය පදයෙහි වරනගයි. | • ත්‍රෛකාලික ආඛ්‍යාතය<br>• පඤ්චමී ආඛ්‍යාතය<br>• සත්තමී ආඛ්‍යාතය<br>• හීයත්තනී ආඛ්‍යාතය<br>• පරොක්ඛා ආඛ්‍යාතය<br>• කාලාතිපත්ති ආඛ්‍යාතය | • ආඛ්‍යාත ප්‍රත්‍යය මාලා වගු ගත කරයි.<br>• ආඛ්‍යාත වගු ගත කර ප්‍රදර්ශනය කරයි.<br>• ආඛ්‍යාත පදයක් කිනම් ආඛ්‍යාතයකට අයත් දැයි ප්‍රකාශ කරයි.<br>• ඒ ඒ ආඛ්‍යාත පදවලට අර්ථ ගන්වයි.<br>• විවිධ ධාතු ඒ ඒ ආඛ්‍යාතවල වරනගා වගු ගත කර දක්වයි.<br>• නියමිත ආඛ්‍යාත මතකයෙන් කියයි; ලියයි. | 10 |

| | | | | |
|---|---|---|---|---|
| **04.<br>පාලි භාෂා රීතියට අනුව වාක්‍ය රචනා කරයි.** | 4.1 සරල වාක්‍ය මගින් වාක්‍ය රචනාවක් ලියයි.<br>4.2 වර්තමාන කාල කර්තෘ කාරක වාක්‍ය කර්ම කාරකයට හරවා ලියයි.<br>4.3 වර්තමාන කාල කර්ම කාරක වාක්‍ය කර්තෘ කාරකයට හරවා ලියයි. | • කර්තෘ, කර්ම, ක්‍රියා සහිත වාක්‍ය<br>• කර්තෘ කාරක වාක්‍ය<br>• කර්ම කාරක වාක්‍ය | • මාතෘකානුකූල ව වැකි පහක රචනාවක් ලියයි.<br>• කර්තෘකාරක වාක්‍යයක මූලික ලක්ෂණ දක්වයි.<br>• කර්මකාරක වාක්‍යයක මූලික ලක්ෂණ දක්වයි.<br>• කර්තෘකාරක වාක්‍ය කර්මකාරකයෙන් ලියා දක්වයි.<br>• කර්මකාරක වාක්‍ය කර්තෘකාරකයෙන් ලියා දක්වයි. | 12 |
| **05.<br>නිවැරදි වියරණ විධි සහිත ව පරිවර්තන කාර්යයේ යෙදෙයි.** | 5.1 සරල පාලි ඡේද රීත්‍යනුකූල ව මාධ්‍ය භාෂාවට නගයි.<br>5.2 මාධ්‍ය භාෂාගත සරල වාක්‍ය පාලි භාෂාවට නගා ලියයි.<br>5.3 කර්තෘකාරක හා කර්ම කාරක වාක්‍ය මාධ්‍ය භාෂාවෙන් පාලි භාෂාවටත් පාලි භාෂාවෙන් මාධ්‍ය භාෂාවටත් නගයි. | • සරල පාලි ඡේද<br>• මාධ්‍ය භාෂාගත සරල වාක්‍ය<br>• කර්තෘකාරක වාක්‍ය<br>• කර්මකාරක වාක්‍ය | • සරල පාලි ඡේද මාධ්‍ය භාෂාවෙන් ලියයි.<br>• මාධ්‍ය භාෂාගත සරල වාක්‍ය පාලි භාෂාවෙන් ලියා දක්වයි.<br>• කර්තෘකාරක හා කර්මකාරක සරල වාක්‍ය මාධ්‍ය භාෂාවට නගයි.<br>• මාධ්‍ය භාෂාගත කර්තෘකාරක සරල වාක්‍ය පාලි භාෂාවට නගා ලියයි. | 16 |
| **06.<br>නිර්දිෂ්ට පාලි පාඨ හා වරනැගීම් වාචෝද්ගත කරයි.** | 6.1 බාලාවතාරයේ නිර්දිෂ්ට කොටස් වාචෝද්ගත කරයි.<br>6.2 ආඛ්‍යාත වරනැගිල්ල වාචෝද්ගත කරයි.<br>6.3 ධාතුමඤ්ජුසාව වාචෝද්ගත කරයි.<br>6.4 නිර්දිෂ්ට සූත්‍ර ගණ සජ්ඣායනය කරයි. | • බාලාවතාර <u>නාම</u> හා <u>සමාස</u> කාණ්ඩ<br>• ආඛ්‍යාත විභක්ති අට<br>• ධාතුමඤ්ජුසාව - 1, 2, 3, 4, 85, 86, 87, 97, 98, 99, 102, 103, 104, 105, 106, 119, 129 ගාථා<br>★ **ධම්මචක්කප්පවත්තන සූත්‍රය** | • බාලාවතාරය <u>නාම</u> හා <u>සමාස</u> කාණ්ඩවලට අයත් සූත්‍ර හා වෘත්ති මතකයෙන් කියයි; ලියයි.<br>• ආඛ්‍යාත වරනැගිල්ලේ නියමිත කොටස් මතකයෙන් නිවැරදි ව ලියා දක්වයි.<br>• ධාතුමඤ්ජුසාවේ නියමිත කොටස් මතකයෙන් ලියයි.<br>• ධම්මචක්කප්පවත්තන සූත්‍රය ගණසජ්ඣායනය කරයි. | 25 |

| | | | | |
|---|---|---|---|---|
| **07.<br>පාලි භාෂාවේ සන්ධි හඳුනාගෙන භාවිත කරයි.** | 7.1 සන්ධි යනු මොනවා දැයි හඳුන්වා සන්ධි ප්‍රභේද නම් කරයි.<br>7.2 සන්ධි ප්‍රභේදවල ලක්ෂණ පෙන්වා දෙයි.<br>7.3 ඒ ඒ සන්ධි ප්‍රභේදය සන්ධි විධි යොදාගෙන විස්තර කරයි. | • සන්ධි විධි හා සන්ධි ප්‍රයෝජන<br>• ස්වර සන්ධි<br>• ව්‍යඤ්ජන සන්ධි<br>• නිග්ගහීත සන්ධි | • සන්ධි යනු මොනවා දැයි හඳුන්වයි.<br>• සන්ධි ප්‍රභේද ලියා දක්වයි.<br>• ඒ ඒ සන්ධියේ මූලික ලක්ෂණ පෙන්වාදෙයි.<br>• ඒ ඒ සන්ධි ප්‍රභේදයට නිදසුන් සපයයි.<br>• සන්ධි විධි යොදා ගනිමින් විසන්ධි පද සන්ධි කරයි.<br>• සන්ධි පද විසන්ධි කොට දක්වයි.<br>• සන්ධි පදයක් කිනම් සන්ධි ප්‍රභේදයකට අයත් දැයි ලියා දක්වයි. | 10 |
| **08.<br>පාලි භාෂාවේ සමාස හඳුනාගෙන භාවිත කරයි.** | 8.1 සමාස යනු මොනවා දැයි හඳුන්වා දෙයි.<br>8.2 සමාස ප්‍රයෝජන ලියා දක්වයි.<br>8.3 සමාස ප්‍රභේද දක්වයි.<br>8.4 ඒ ඒ සමාස ප්‍රභේදයට නිදසුන් සපයයි.<br>8.5 සමාසයන්හි පදසාධනය පැහැදිලි කරයි. | • සමාස හැඳින්වීම<br>• සමාස ප්‍රයෝජන<br>• සමාස ප්‍රභේද<br>• සමාස පද සාධනය | • සමාස පදයක ලක්ෂණ පෙන්වා දෙයි.<br>• සමාස ප්‍රභේද නම් කරයි.<br>• ඒ ඒ සමාස ප්‍රභේදය සඳහා නිදසුන් දක්වයි.<br>• සමාස පද සකසා ගන්නා අයුරු පෙන්වා දෙයි.<br>• සමාස ප්‍රයෝජන ලියා දක්වයි. | 07 |
| **09.<br>පාලි භාෂාවේ තද්ධිත හඳුනාගෙන භාවිත කරයි.** | 9.1 තද්ධිත පිළිබඳ හැඳින්වීමක් කොට තද්ධිත ප්‍රභේද නම් කරයි.<br>9.2 තද්ධිත ප්‍රභේද පිළිබඳ විස්තර කොට ඒ ඒ ප්‍රභේදයට නිදසුන් සපයයි.<br>9.3 තද්ධිත පදයක් හඳුනාගෙන එහි ප්‍රභේදය නම් කරයි. | • තද්ධිත හැඳින්වීම<br>• තද්ධිත ප්‍රභේද<br>• තද්ධිත ප්‍රයෝජන<br>• තද්ධිත පද සාධනය | • තද්ධිත නාමයක් යනු කුමක් දැයි පැහැදිලි කරයි.<br>• තද්ධිත ප්‍රභේද නම් කරයි.<br>• ඒ ඒ තද්ධිත ප්‍රභේද නිදසුන් මගින් පැහැදිලි කරයි.<br>• දෙනු ලබන තද්ධිත පදයක ප්‍රභේදය නම් කරයි.<br>• තද්ධිත පදයක් සාදා ගන්නා ආකාරය පෙන්වා දෙයි.<br>• නාමයකට තද්ධිත ප්‍රත්‍යයක් එක්කොට තද්ධිත නාමයක් සාදා ගනී. | 07 |

| | | | | |
|---|---|---|---|---|
| **10. පාලි භාෂාවේ කිතක හඳුනාගෙන භාවිත කරයි.** | 10.1 කිතක පද භාවිතය පෙන්වා දෙයි.<br>10.2 කිතක හඳුන්වා කිතක ප්‍රභේද නම් කරයි.<br>10.3 කිතක ප්‍රභේදයන්ට නිදසුන් සපයයි. | • කිතක නාම<br>• කිතක ආඛ්‍යාත<br>• කිත් ප්‍රත්‍යය<br>• කිතක<br>• ත්‍රෛකාලික කිතක | • නාමපද වශයෙන් කිතක යෙදෙන අයුරු දක්වයි.<br>• ක්‍රියාපද වශයෙන් කිතක යෙදෙන අයුරු දක්වයි.<br>• කිතක යනු මොනවා දැයි හඳුන්වයි.<br>• කිතක ප්‍රභේද නම් කරයි.<br>• ඒ ඒ කිතක ප්‍රභේදයට නිදසුන් සපයයි.<br>• විවිධ ධාතු යොදා ගනිමින් කිතක පද සකස් කරයි.<br>• නිර්දිෂ්ට පාඨවල ඇති කිතක පද උපුටා දක්වයි. | 07 |
| **11. නිර්දිෂ්ට ගද්‍ය පද්‍ය පාඨ පරිවර්තනය සඳහා කියවයි.** | 11.1 නිර්දිෂ්ට ගද්‍ය පද්‍ය කොටස් අර්ථාවබෝධයෙන් යුතු ව කියවයි.<br>11.2 නිර්දිෂ්ට ගද්‍ය පද්‍ය පාඨ මාධ්‍ය භාෂාවට නගයි.<br>11.3 නිර්දිෂ්ට කොටස් රුචිකත්වයෙන් යුතු ව කියවයි.<br>11.4 නිර්දිෂ්ට පාඨවල ඇති වටිනාකම් ප්‍රකාශ කරයි. | • මහාවංසය - 6 පරිච්ඡේදය<br>➢ විජයාගමනං<br>• පාලි පාඨාවලී - 1 - 10 කථා<br>➢ මච්ඡරී බ්‍රාහ්මණො<br>➢ අකාරුණිකො වෙජ්ජො<br>➢ බුද්ධුපට්ඨාකා ද්වෙ තිරච්ඡානා<br>➢ උජුපාතිකො සුනඛො<br>➢ කතඤ්ඤූ සිගාලො<br>➢ කතවෙදී සුනඛො<br>➢ නකුලඋපාසකස්ස වත්ථු<br>➢ අඤ්ඤෙසං කතො අනත්ථො අත්තනො උපරි පතිස්සති<br>➢ මුඛරභාවස්ස දොසො<br>➢ පණ්ඩිත අතිපණ්ඩිත වාණිජා | • නිර්දිෂ්ට ගද්‍ය පද්‍ය කොටස් රුචිකත්වයෙන් යුතු ව කියවයි; අර්ථාවබෝධය ඇති කර ගනී.<br>• රස වින්දනයේ යෙදෙයි.<br>• පාලි පාඨ මාධ්‍ය භාෂාවට නගයි.<br>• සාරධර්ම චරිතායනය කරයි.<br>• නියමිත කථාවස්තු කෙටියෙන් කියයි. | 32 |

නිර්දිෂ්ට ග්‍රන්ථ :- පාලි භාෂාව - 4 ශ්‍රේණිය - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

★ තද කළු අකුරින් මුද්‍රිත කොටස් ගණසජ්ඣායනය සඳහා පමණි.

# 05 ශ්‍රේණිය - පාලි විෂය නිර්දේශය

බහුස්සුතො ච මෙධාවී - සීලෙසු සුසමාහිතො,
චෙතො සමථමනුයුත්තො - අපි මුද්ධනි තිට්ඨතු.

(යමෙක් බහුශ්‍රැත නම් ප්‍රඥාවන්ත නම් ශීලයෙහි මනාව පිහිටියේ නම්
චිත්ත සමථයෙහි යෙදුණේ නම් හෙතෙම මාගේ මුදුනෙහි පවා සිටීවා!)

- සාරිපුත්තථෙරගාථා -

# 05 ශ්‍රේණිය - පාලි විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 01. පාලි අක්ෂර මාලාව ප්‍රභේද ගත කරයි. | 1.1 පාලි අක්ෂර මාලාව නිවැරදි ව පිළිවෙළින් ලියයි.<br>1.2 ස්වර හා ව්‍යඤ්ජන වශයෙන් ප්‍රභේද කර දක්වයි.<br>1.3 උත්පත්ති ස්ථාන අනුව අක්ෂර වගුගත කරයි.<br>1.4 පාලි වචන අකාරාදි පිළිවෙළට ලියයි.<br>1.5 සංයෝගාක්ෂර පිළිබඳ විස්තරයක් කරයි. | • අක්ෂර මාලාව<br>• අක්ෂර ප්‍රභේද<br>• අක්ෂර උත්පත්ති ස්ථාන<br>• සංයෝගාක්ෂර | • පාලි අක්ෂර මාලාව නිවැරදි ව උච්චාරණය කර ලියා දක්වයි.<br>• අක්ෂර ප්‍රභේද වගු ගතකර දක්වයි.<br>• අක්ෂර උත්පත්ති ස්ථාන ලියා දක්වයි.<br>• ඒ ඒ උත්පත්ති ස්ථානයට අයත් අක්ෂර ලියයි.<br>• විවිධ සංයෝගාක්ෂර ගෙන හැර දක්වයි.<br>• සංයෝගාක්ෂර යෙදුණු වචන නිවැරදි ව ලියයි.<br>• බාලාවතාර සූත්‍ර ආශ්‍රයෙන් වර්ණ මාලාව පැහැදිලි කරයි. | 05 |
| 02. පාලි නාමපද විභක්ත්‍යර්ථ පිළිබඳ අවබෝධයෙන් භාවිත කරයි. | 2.1. නාම විභක්ති අර්ථ ගෙනහැර දක්වයි.<br>2.2 කාරක හඳුන්වා, ඒ ඒ කාරකයට නිදසුන් සපයයි.<br>2.3 උපපද විභක්ති හඳුන්වා දෙයි.<br>2.4 විභක්ති ප්‍රයෝගවලට නිදසුන් සපයයි. | • නාම විභක්ති 09<br>• කාරක 06<br>• උපපද විභක්ති<br>• ඒ ඒ විභක්ති ප්‍රයෝග | • නාම විභක්ති පිළිවෙළින් ලියා විභක්ති අර්ථ ගන්වයි.<br>• නාමපද කිනම් විභක්තියකට අයත් දැයි ලියා දක්වයි.<br>• කාරක 06 නම් කොට නිදසුන් සපයයි.<br>• කාරකාර්ථ සපයන විභක්ති නම් කරයි.<br>• කාරක නො වන විභක්ති පෙන්වා දෙයි.<br>• උපපද විභක්තිවලට නිදසුන් සපයයි.<br>• ඒ ඒ විභක්ති ප්‍රයෝගය හඳුන්වා නිදසුන් දෙයි. | 15 |

| | | | | |
|---|---|---|---|---|
| **03.**<br>**විවිධ ආඛ්‍යාත ප්‍රභේද උචිත පරිදි භාවිත කරයි.** | 3.1 ආඛ්‍යාත විභක්ති අට වාචෝද්ගත කරයි; වගු ගත කරයි.<br>3.2 ප්‍රත්‍යයමාලා යොදා ගනිමින් ආඛ්‍යා වගු ගත කරයි.<br>3.3 ධාතු ගණ හා විකරණ ප්‍රත්‍යය යොදා ගනිමින් විවිධ ආඛ්‍යාත පද සාදා ගනියි.<br>3.4 වාක්‍යවල ඇති ආඛ්‍යාත උපුටා ආඛ්‍යාත ප්‍රභේද නම් කරයි. | • ආඛ්‍යාත විභක්ති අට<br>• ධාතු ගණ | • ආඛ්‍යාත ප්‍රත්‍යය මාලා වගු ගත කරයි.<br>• දෙනු ලබන ආඛ්‍යාත පද කිනම් ආඛ්‍යාතයකට අයත් දැයි ලියා දක්වයි.<br>• ධාතු ගණ අට ලියා දක්වයි.<br>• ඒ ඒ ධාතු ගණයට අයත් විකරණ ලියා දක්වයි.<br>• වර්තමාන ධාත්‍වංගය සකසා ගනියි.<br>• ආඛ්‍යාත පදය කිනම් ධාතු ගණයකට අයත් දැයි සොයා ලියයි. | 15 |
| **04.**<br>**පාලි භාෂා රීතියට අනුව වාක්‍ය රචනා කරයි.** | 4.1 කර්තෘ, කර්ම, ක්‍රියා සහිත වාක්‍ය ලියා දක්වයි.<br>4.2 නාම විශේෂණ, ක්‍රියා විශේෂණ යොදා වාක්‍ය දිගු කරයි.<br>4.3 වාක්‍ය නිර්මාණයේ දී උපසර්ග නිපාත භාවිත කරයි.<br>4.4 සංඛ්‍යානාම, පූර්වක්‍රියා, තුමන්තක්‍රියා යොදා ගනිමින් වාක්‍ය රචනා කරයි.<br>4.5 මාතෘකාවක් අනුව වචන 30ක පමණ සරල වාක්‍ය රචනයක් ලියයි.<br>4.6 කර්තෘකාරක හා කර්මකාරක වාක්‍ය ලියා දක්වයි. | • උක්ත, කර්ම, ආඛ්‍යාත<br>• උපසර්ග හා නිපාත<br>• පූර්වක්‍රියා, තුමන්තක්‍රියා<br>• සංඛ්‍යා නාම | • සරල වාක්‍ය රචනා කරයි.<br>• විවිධ පද යොදා ගනිමින් වාක්‍ය දිගු කර ලියයි.<br>• කර්තෘකාරක වාක්‍ය කර්මකාරකයෙන් ලියයි.<br>• කර්මකාරක වාක්‍ය කර්තෘකාරකයෙන් ලියා දක්වයි.<br>• වචන 30ක පමණ වාක්‍ය රචනයක් රීත්‍යනුකූල ව ලියයි. | 10 |
| **05.**<br>**නිවැරදි වියරණ විධි සහිත ව පරිවර්තන කාර්යයේ යෙදෙයි.** | 5.1 පරිවර්තනයක දී අනුගමනය කළ යුතු මූලික කරුණු තේරුම් ගනියි.<br>5.2 පාලි වාක්‍ය මාධ්‍ය භාෂාවට නගයි.<br>5.3 මාධ්‍ය භාෂාගත වාක්‍ය පාලි භාෂාවට නගයි.<br>5.4 විවිධ පද යොදා ගනිමින් දිගු වාක්‍ය රචනා කරයි.<br>5.5 විවිධ ආඛ්‍යාත පද යොදා ගනිමින් වාක්‍ය නිර්මාණය කරයි. | • ආඛ්‍යාත විභක්ති අට<br>• උපසර්ග<br>• නිපාත<br>• පූර්වක්‍රියා<br>• තුමන්තක්‍රියා<br>• ප්‍රයෝජ්‍යක්‍රියා<br>• නිර්දිෂ්ට නාම වරනැඟීම | • පරිවර්තන රීති අනුගමනය කරමින් වාක්‍ය මාධ්‍ය භාෂාවට පරිවර්තනය කරයි.<br>• මාධ්‍ය භාෂාගත වාක්‍ය රීත්‍යනුකූල ව පාලියට නගයි.<br>• සරල වාක්‍ය දිගු වාක්‍ය බවට පත්කොට පරිවර්තනය කරයි.<br>• කර්තෘකාරක හා කර්මකාරක වාක්‍ය මාධ්‍ය භාෂාවෙන් පාලි භාෂාවටත් පාලි භාෂාවෙන් මාධ්‍ය භාෂාවටත් පරිවර්තනය කරයි. | 15 |

| | | | | |
|---|---|---|---|---|
| 06.<br>නිර්දිෂ්ට පාලි පාඨ හා වරනැගීම් වාචෝද්ගත කරයි. | 6.1 බාලාවතාරයේ නිර්දිෂ්ට කොටස් වාචෝද්ගත කරයි.<br>6.2 පාලි වරනැගිල්ලේ නියමිත කොටස් වාචෝද්ගත කරයි.<br>6.3 ආඛ්‍යාත වරනැගිල්ල වාචෝද්ගත කරයි. | • බාලාවතාර තද්ධිත හා කිතක කාණ්ඩ<br>• 1-4 ශ්‍රේණිවලට නිර්දිෂ්ට සියලු නාම වරනැගීම්<br>• ආඛ්‍යාත වරනැගීම් (ආඛ්‍යාත විභක්ති 8)<br>★ ආටානාටිය සූත්‍රය | • තද්ධිත හා කිතක පද සාධනයේ දී බාලාවතාරය සූත්‍ර භාවිත කරයි.<br>• නාම වරනැගීම ලිංග හා ශබ්දාන්ත වශයෙන් වෙනස් වන බව දක්වයි.<br>• දෙනු ලබන ධාතුවක් ආඛ්‍යාතය විභක්තියක උභය පදයේ වරනගයි.<br>• ආටානාටිය සූත්‍රය ගණ සජ්ඣායනය කරයි. | 10 |
| 07.<br>පාලි භාෂාවේ සන්ධි හඳුනාගෙන භාවිත කරයි. | 7.1 සන්ධි හඳුන්වා සන්ධියේ ප්‍රයෝජන දක්වයි.<br>7.2 සන්ධි කාර්ය ලියා දක්වා නිදසුන් සපයයි.<br>7.3 සන්ධි ප්‍රභේද නම් හඳුන්වා නිදසුන් සපයයි.<br>7.4 සන්ධිපද විසන්ධි කර දක්වයි. සන්ධි ප්‍රභේද ද ලියයි.<br>7.5 විසන්ධිපද බාලාවතාර සූත්‍ර ඇසුරෙන් සන්ධි කරයි. | • සන්ධි විධි<br>• සන්ධි ප්‍රයෝජන<br>• සන්ධි ප්‍රභේද<br>• බාලාවතාර සූත්‍ර | • සන්ධි හඳුන්වයි.<br>• සන්ධි ප්‍රයෝජන ලියයි.<br>• සන්ධි කාර්ය නම් කරයි.<br>• සන්ධි ප්‍රභේද හඳුන්වයි.<br>• සන්ධිපද විසන්ධි කර දක්වයි.<br>• විසන්ධිපද සන්ධි කිරීමේ දී බාලාවතාර සූත්‍ර දක්වයි.<br>• භාවිතයේ පවතින සන්ධි පද උපුටා දක්වයි. | 10 |
| 08.<br>පාලි භාෂවේ සමාස හඳුනාගෙන භාවිත කරයි. | 8.1 සමාස හඳුන්වා සමාස ප්‍රයෝජන ලියා දක්වයි.<br>8.2 සමාස පද සාදා ගන්නා ආකාරය හා හඳුනා ගන්නා ආකාරය පැහැදිලි කරයි.<br>8.3 නිදසුන් සහිතව සමාස ප්‍රභේද පැහැදිලි කරයි.<br>8.4 බාලාවතාර සූත්‍ර ඇසුරෙන් සමාස පද විග්‍රහ කරයි. | • සමාස හඳුනා ගැනීම<br>• සමාස ප්‍රයෝජන<br>• සමාස ප්‍රභේද<br>• නිදර්ශන<br>• බාලාවතාර සූත්‍ර පාඨ | • සමාස කෙටියෙන් හඳුන්වයි.<br>• සමාස ප්‍රයෝජන ලියයි.<br>• සමාස පද විග්‍රහ කොට සාදා ගන්නා ආකාරය පෙන්වා දෙයි.<br>• සමාස පදයක් හඳුනා ගන්නා ආකාරය ලියා දක්වයි; පැහැදිලි කරයි.<br>• සමාස ප්‍රභේද ලියා දක්වයි.<br>• ඒ ඒ ප්‍රභේදයට නිදසුන් සපයයි.<br>• බාලාවතාර සූත්‍ර ඇසුරින් සමාස පද සාධනය කරයි. | 10 |

| | | | | |
|---|---|---|---|---|
| **09.**<br>**පාලි භාෂාවේ තද්ධිත හඳුනාගෙන භාවිත කරයි.** | 9.1 තද්ධිත හඳුන්වා ප්‍රයෝජන දක්වයි.<br>9.2 තද්ධිත පදයක් සාදා ගන්නා ආකාරය පැහැදිලි කරයි.<br>9.3 තද්ධිත ප්‍රභේද නම් කරයි.<br>9.4 ඒ ඒ ප්‍රභේදයට නිදසුන් සපයයි.<br>9.5 බාලාවතාර සූත්‍රානුසාරයෙන් තද්ධිත පද සාධනය කරයි.<br>9.6 තද්ධිත පද උපුටා දක්වා ප්‍රභේදය නම් කරයි. | • තද්ධිත හැඳින්වීම<br>• තද්ධිත ප්‍රයෝජන<br>• තද්ධිත ප්‍රභේද<br>• බාලාවතාර සූත්‍ර පාඨ | • තද්ධිත කෙටියෙන් හඳුන්වා දෙයි.<br>• තද්ධිත ප්‍රයෝජන ලියා දක්වයි.<br>• පියවරෙන් පියවර තද්ධිත පද සකස් කර ගන්නා ආකාරය පෙන්වා දෙයි.<br>• තද්ධිත ප්‍රභේද ලියා දක්වයි.<br>• නිදසුන් මගින් තද්ධිත ප්‍රභේද විස්තර කරයි.<br>• බාලාවතාර සූත්‍රානුසාරයෙන් තද්ධිත පද සකස් කර ගනී.<br>• තද්ධිත පද හඳුනාගෙන තද්ධිත ප්‍රභේදය ලියා දක්වයි. | 10 |
| **10.**<br>**පාලි භාෂාවේ කිතක හඳුනාගෙන භාවිත කරයි.** | 10.1 කිතක පද හඳුන්වයි.<br>10.2 කිතක පද සාධනය පැහැදිලි කරයි.<br>10.3 කිතක ප්‍රභේද ලියා දක්වයි.<br>10.4 බාලාවතාර සූත්‍රානුසාරයෙන් කිතක පද යොදයි. | • කිතක හැඳින්වීම<br>• කිතක ප්‍රයෝජන<br>• කිතක ප්‍රභේද | • කිතක නාම හා ක්‍රියා අව්‍යය වශයෙන් භාවිත වන බව පෙන්වා දෙයි.<br>• බාලාවතාර සූත්‍රානුසාරයෙන් කිතක පද සාදයි.<br>• කිතක ප්‍රභේද ලියා නිදසුන් දෙයි.<br>• කිතක පද උපුටා දක්වයි.<br>• කිතක පද යොදා වාක්‍ය නිර්මාණය කරයි. | 10 |
| **11.**<br>**නිර්දිෂ්ට ගද්‍ය පද්‍ය පාඨ පරිවර්තනය සඳහා කියවයි.** | 11.1 නිර්දිෂ්ට ගද්‍ය පද්‍ය කොටස් අර්ථාවබෝධයෙන් යුතු ව කියවයි.<br>11.2 නිර්දිෂ්ට ගද්‍ය පද්‍ය පාඨ මාධ්‍ය භාෂාවට නගයි.<br>11.3 පාලි පාඨ රුචිකත්වයෙන් යුතු ව කියවයි.<br>11.4 නිර්දිෂ්ට පාඨවල ඇති ජීවන දර්ශනය හඳුනාගනියි. | • මහාපජාපතී අපදානය<br>• උදානපාළි<br>➢ සංගාමජි සුත්ත<br>➢ ගබ්භිනී සුත්ත<br>➢ නන්ද සුත්ත | • නිර්දිෂ්ට ගද්‍ය පද්‍ය කොටස් රුචිකත්වයෙන් යුතු ව කියවයි, අර්ථාවබෝධය ඇති කර ගනී.<br>• රස වින්දනයේ යෙදෙයි.<br>• ධර්ම කරුණු එක්රැස් කරයි.<br>• පාලි පාඨ මාධ්‍ය භාෂාවට නගයි.<br>• සාරධර්ම චරිතායනය කරයි.<br>• සූත්‍රපාඨ යොදා ගනිමින් ධර්ම දේශනා පවත්වයි. | 34 |
| **12.**<br>**පාලි සාහිත්‍යයේ සුවිශේෂ චරිත හඳුනා ගෙන චරිතායනය කරයි.** | 12.1 අදාළ චරිතවලින් පාලි සාහිත්‍යයේ පෝෂණයට සිදු වූ මෙහෙය ලියා දක්වයි.<br>12.2 අදාළ චරිතවලින් පාලි සාහිත්‍යයේ පෝෂණයට සිදු වූ සේවාව පිළිබඳ ශිෂ්‍ය සමිතියේ දී කථාවක් පවත්වයි. | • අටුවාචාරී බුද්ධඝෝෂ හිමි<br>• දිඹුලාගල මහාකාශ්‍යප හිමි<br>• පොල්වත්තේ බුද්ධදත්ත නාහිමි<br>• රීස් ඩේවිඩ්ස් පඬිතුමා | • අදාළ චරිතවලින් පාලි සාහිත්‍යයේ සංවර්ධනය උදෙසා වූ උදාර දායකත්වය අභිරුචියෙන් යුක්ත ව පෙන්වා දෙයි.<br>• පාලි සාහිත්‍යයේ පෝෂණය උදෙසා තම දායකත්වය ලබාදෙයි. | 06 |

නිර්දිෂ්ට ග්‍රන්ථ - පාලි භාෂාව - 5 ශ්‍රේණිය - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

★ තද කළු අකුරින් මුද්‍රිත කොටස් ගණසජ්ඣායනය සඳහා පමණි.